යම් අයෙකු කොවිඩ්-19 ආසාදිතයෙකු වන්නේ ඔහුගේ හෝ ඇයගේ වරදකින් නොවේ. නමුත් ඇතැම් මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් වන පුවත් වාර්තාවන් ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයන් සහ නිරෝධායනයට ලක්වන්නන් වරදකරුවන් ලෙසින් චිත්‍රණය වීම සැබවින්ම කණගාටුවට කරුණකි.

එයට උදාහරණයක් ලෙස "ගම්පොළ කරක් ගැසූ කොවිඩ් ආසාදිතයකු නිසා පවුල් 30 ක් නිරෝධායනයේ" යන සිරස්තලයෙන් යුතුව අරුණ පුවත්පතේ (10/20) පළවූ පුවත් වාර්තාව දැක්විය හැක.

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති නිර්දේශ මාලාවේ දැක්වෙන එක් නිර්දේශයක් වන්නේ, "වෛරසය ආසාදිත පුද්ගලයින් රෝගීන් මිස අනෙක් අයට රෝගය පතුරුවන පුද්ගලයින් ලෙස හැඳින්වීමෙන් වළකින්න" යන්නයි. මෙම නිර්දේශය ඇතුළු එම මාධ්‍ය සඳහා වන නිර්දේශ මාලාව පිළිනොපදිමින් සිදුකරනා වාර්තාකරණයෙන් වන බරපතළම අගතිය වන්නේ, ඒ ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයින් සම්බන්ධයෙන් සමාජය තුළ නිර්මාණය වන කොන් කිරීමේ ආකල්පය නිසා, රෝගය ආසාදිත පුද්ගලයින් කොන්වීමට ඇති බිය නිසා නිසි වෛද්‍ය උපදෙස් හෝ ප්‍රතිකාර නොගෙන සැඟවීමට උත්සාහ කිරීමත්, ඒ ඔස්සේ කොවිඩ්-19 මර්දන ප්‍රයත්නයන්ට බාධා ඇති වීමත් වේ.

මාධ්‍ය විසින් කොවිඩ්-19 සම්බන්ධව ආචාර ධර්මානුකූල වාර්තාකරණයක යෙදීම අත්‍යාවශ්‍ය වන්නේ එහෙයිනි.

මූලාශ්‍ර: [https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...](https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...)
**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Coronavirus #Aruna**